# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT 2018

## ඉඩම් මැනුම් සභාව
## நில அளவைச் சபை
## Land Survey Council


ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05
நில அளவைச் சபை, நில அளவையாளர் அதிபதி அலுவலகம்,இல.150 பெர்னாட்கொழும்பு 05
**Land Survey Council, Surveyor General's Office,No 150, Colombo 05**

පටුන


| | | |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ පණිවුඩය | 02 |
| 2. | දැක්ම සහ මෙහෙවර | 03 |
| 3. | ඉඩම් මැනුම් සභාව | 04 |
| 4. | ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් | 05 |
| 5. | ඉඩම් මැනුම් සභාව සතු බලතල | 06 |
| 6. | 2018 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය | 07 |
| 7. | ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය | 08 |
| 8. | ක්‍රියාකාරකම් | 09 |
| 9. | අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු | 13 |
| 10. | මූල්‍ය කළමනාකරණය | 15 |
| 11. | 2018 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන (ඇමුණුම්) | |

- i). මූල්‍ය තත්ව ප්‍රකාශනය
- ii). මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය
- iii). ශුද්ධ වත්කම් බැරකම් ප්‍රකාශනය
- iv). මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- v). 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන
- vi). 2018 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති

12. විගණකාධිපති වාර්තාව 2018

# 01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව
අංක150, බර්නාඩ් සොයිසා මාවත
නාරාහේන්පිට, කොළඹ 05
2019.07.

2002 අංක 17 දරණ මැනුම් පනත තුළින් ඉඩම් මැනුම් සභාවට පැවරී ඇති කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දෝරුවරුන් සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, වෘත්තීමය මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය විනය පාලනය මැනුම් සභාවේ වගකීම වේ. එපමණක්නොව, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත්, වෙනත් වෘත්තීයමය ආයතන සමඟ සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම්වලට අයත්ය.ගුණාත්මකව උසස් මැනුම් සේවාවක් සැපයීම වස් වෘත්තීයවේදීන් ශක්තිමත් කිරීමට 2018 වසර තුළ ඉඩම් මැනුම් සභාවට හැකියාවක් ලැබීම පිළිබඳ බෙහෙවින් සතුටුවෙමි.

මැනුම් පනතේ විධිවිධානවලට අනුව ඉඩම් මැනුම් කටයුතු නියාමනය කිරීම පනත ක්‍රියාත්මක වී දශකයකටත් වැඩිකාලයක් ගත වූ පසුව හෝ 2016 වසරේදී ඒ සඳහා අදාළ තාක්ෂණික උපදෙස් මාලාවක් සකස් කර ඒ හරහා මැනුම් කටයුතු නියාමනය සඳහා කටයුතු යොදන ලදී.

කෙටියෙන් සඳහන් කරන්නේ නම් සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුම තම වෘත්තීය කටයුතු ක්‍රමවත්ව සහ නියමිත ප්‍රමිතීන්ට අනුව පවත්වාගැනීමට උනන්දු කරවීම මෙම රෙගුලාසි වල අපේක්ෂාව විය. මිනින්දෝරු වෘත්තිය සම්බන්ධ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය සහ කැපවීම මගින් එළි දුටු මෙම රෙගුලාසි අනුව කටයුතු කිරීම සෑම මිනින්දෝරු වෘත්තිකයෙකුට මෙන්ම පොදුවේ රටටම ප්‍රතිලාභ අත්වන්නක් බව මා තරයේ විශ්වාස කරමි. මෙම අත්හදා බැලීම් තුළින් ඉදිරිපත් වන කරුණු අනුව අදාළ රෙගුලාසි සංශෝධනය/වැඩිදියුණු කර ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ඇත.

මැනුම් සභාව සඳහා www.landsurveycouncil.org නමින් වෙබ් අඩවියක් මෙම වසරේදී දියත් කරන ලද අතර වෘත්තිකයන් හා පොදුජනතාව අතරට යාම සඳහා වඩාත් සාර්ථක මාධ්‍යයක් ලෙස එය හඳුනා ගන්නා ලදී. මැනුම් සභාවේ ලියාපදිංචිය මෙන්ම තොරතුරු ලබාදීම වැනි කටයුතුද වඩාත් කාර්යක්ෂමව මෙම වෙබ් අඩවිය හරහා සිදු කරනු ලැබේ.

ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය මෙන් ම වෘත්තීමය විනය පවත්වා ගැනීම උදෙසා 2016 වසරේදීද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට අඛණ්ඩ වෘත්තීමය සංවර්ධන පුහුණු පාඨමාලා කිහිපයක්ම අනුමත කොට පැවැත්වීමට ඉඩම් මැනුම් සභාව විශේෂයෙන් කටයුතු කර ඇත. එහිදී පාඨමාලාවලට සහභාගීවීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් දක්වන ලද උනන්දුව කැපී පෙනුනි.

සමාලෝචිත කාලසීමාව තුළ පැවති කාර්ය මණ්ඩල හිඟයද අභිබවමින් ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වාගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධකාලීන) ඇතුළු සමස්ත කාර්යමණ්ඩලය මෙන්ම උප සභාපති ඇතුළු ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තූතිය පුද කරමි.

පී.එම්.පී. උදයකාන්ත
සභාපති

## 02. දැක්ම සහ මෙහෙවර

### දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වාගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත්වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගීතාව තහවුරු කර ඒ තුළින් තරගකාරි ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තීය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගතවී වෘත්තීමය පරිසරය ශක්තිමත් කිරීම අපගේ දැක්මවේ.

### මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා, වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරණ මැනුම් පනතේ සඳහන් විධි විධාන අනුව 2003 වර්ෂයේ මාර්තු මාසයේදී කොළඹ 05, බර්නාඩ් ද සොයිසා මාවත,අංක 150 දරණ ලිපිනයේ පිහිටා ඇතිසර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුළ ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලද අතර එදින පටන් මේ දක්වාම එම ස්ථානයේ ඉඩම් මැනුම් සභාව පවත්වා ගෙන එනු ලැබේ.

මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතුද යන්න පිළිබඳව විධි විධාන සලස්වා ඇත. එකී විධි විධාන වලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත් වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා

ii. උප සභාපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරණ ලියාපදිංචි මිනින්දෝරු වරයෙකු

iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත් කරන සාමාජිකයින්

i. සාමාජික `- 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. - 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන, විශ්ව විද්‍යාලයක අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂෙත්‍රයන් හි එක් විද්වතෙකු

iii. මෙම පත්කිරීම් අමාත්‍යාවරයා විසින් කරනු ලැබේ.

## 04. ඉඩම් මැනුම් සභාව වෙත පැවරී ඇති කාර්යභාරයන්

ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් මැනුම් පනතේ 37 වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්යය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉඩම් මැනිමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහිමට පත්වන අවස්ථාවන්හි ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවරුන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තීමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂාවෙන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණුවලදී සම තත්වයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යොන්‍යය වැඩපිළිවෙළවල් සඳහා එකඟතාවය ඇති කර හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තීමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම.

## 05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

ඉඩම් මැනුම් සභාව වෙත පැවරෙන බලතල මැනුම් පනතේ 38 වැනි වගන්තිය යටතේ පහත පරිදි දක්වා ඇත.

( අ ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කරගැනීම,දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම,විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

( ආ ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීම සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදාගැනීම .

( ඇ ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

( ඈ ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

( ඉ ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

( ඊ ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

( උ ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

( ඌ ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

TINYWOW

## 06. 2018 වර්ෂය තුළ දී ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධනය

### 1. 2018 ජනවාරි මස 1සිට දෙසැම්බර් මස 31දක්වා කාලය තුළ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයන්

සමාලෝචිත වර්ෂය තුළ, එනම්, 2018 ජනවාරි මස 1 සිට දෙසැම්බර් මස 31දක්වා කාලය තුළ ඉඩම් මැනුම් සභාවේ පහත නම් සඳහන් අය සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

| අනු අංකය | නම | තනතුර | කාලසීමාව |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 2018-01-01 සිට2018-12-31 දක්වා |
| 2 | එස්.එම්.පී.පී. සංගක්කාර මහතා | උපසභාපති | 2018-01-01 සිට2018-12-31 දක්වා |
| 3 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහ මහතා | සාමාජික | 2018-02-07 සිට2018-12-31 දක්වා |
| 4 | එන්.ජ්.ගුණවර්ධන මහතා | සාමාජික | 2018-01-01 සිට2018-12-31 දක්වා |
| 5 | කේ.ජ්.කේ.එල්.එදිරිසිංහ මහතා | සාමාජික | 2018-01-01 සිට2018-12-31 දක්වා |
| 6 | ජේ.එම්.විජේවර්ධන මහතා | සාමාජික | 2018-01-01 සිට2018-12-31 දක්වා |
| 7 | ආචාර්ය.එන්.කේ.වික්‍රමාරච්චි මහතා | සාමාජික | 2018-01-01 සිට2018-12-31 දක්වා |

### 2. 2018 දෙසැම්බර් මස 31දිනට සභාවේ සාමාජිකයන්ගේ මුළු සේවාකාල

2018 දෙසැම්බර් මස 31 දිනට සභාවේ සාමාජිකයින් සේවය කරන ලද මුළු සේවා කාල පරිච්ඡේදයන් පහත දක්වා ඇත.

| අනු අංකය | නම | තනතුර | කාලසීමාව |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 2014-05-30 සිට (අවු. 04 මාස 07 දින 02) |
| 2 | එස්.එම්.පී.පී. සංගක්කාරමහතා | උපසභාපති | 2014.05.30 සිට (අවු. 04 මාස 07 දින 02) |
| 3 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහ මහතා | සාමාජික | 2017.02.05 සිට(අවු 01 මාස 10 දින 24 ) |
| 4 | එන්.ජ්.ගුණවර්ධන මහතා | සාමාජික | 2018.01.01 සිට (අවු. 00 මාස 12 දින 00) |
| 5 | කේ.ජ්.කේ.එල්.එදිරිසිංහමහතා | සාමාජික | 2018.01.01 සිට (අවු. 00 මාස 12 දින 00 |
| 6 | ජේ.එම්.විජේවර්ධන මහතා | සාමාජික | 2018.01.01 සිට (අවු. 00 මාස 12 දින 00) |
| 7 | ආචාර්ය.එන්.කේ.වික්‍රමාරච්චි මහතා | සාමාජික | 2018.01.01සිට (අවු. 00 මාස 12 දින 00 |

## 3. සභාවේ රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගිවීම්

වර්ෂය තුළදී එක් එක් සාමාජිකයින් සභා රැස්වීම් වලට සහභාගි වී ඇති වාර ගණන පහත දක්වා ඇත.

| අනු අංකය | නම | තනතුර | රැස්වීම් ගණන |
|---|---|---|---|
| 1 | පී.එම්.පී උදයකාන්ත මහතා | සභාපති | 17 |
| 2 | එස්.එම්.පී.පී. සංගක්කාර මහතා | උපසභාපති | 18 |
| 3 | ඩබ්ලිව්.එම්.එස්.වීරසිංහ මහතා | සාමාජික | 19 |
| 4 | එන්.ජ්.ගුණවර්ධන මහතා | සාමාජික | 20 |
| 5 | කේ.ජ්.කේ.එල්.එදිරිසිංහ මහතා | සාමාජික | 19 |
| 6 | ජේ.එම්.විජේවර්ධන මහතා | සාමාජික | 18 |
| 7 | ආචාර්ය.එන්.කේ.වික්‍රමාරච්චි මහතා | සාමාජික | 06 |

## 07. ඉඩම් මැනුම් සභාවේ කාර්යාලීය කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත් කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව, පහත නම් සඳහන් කාර්ය මණ්ඩලය සමාලෝචිත කාල සීමාව තුළ මැනුම් සභාවේ කාර්යාලීයකාර්ය මණ්ඩලය ලෙස කටයුතු කර ඇත.

| අනු අංකය | නම | තනතුර | කාලසීමාව |
|---|---|---|---|
| 1 | ජී.ඩී.එස්.කේ. ගුණරත්න මහතා | වැඩබලන ලේකම් | 2009.01.01සිට2018.11.17 දක්වා |
| 2 | එස්.ඩී.පී.ජී.එන්.පී.ජයරත්න මිය | ගණකාධිකාරි(අර්ධකාලීන) | 2017.09.01සිට2018.05.31 දක්වා |
| 3 | ටී.ඩී.දේවපුර මිය | ගණකාධිකාරි(අර්ධකාලීන) | 2018.08.01සිට2018.12.31 දක්වා |
| 4 | ඩබ්ලිව්.ජී.එස්.ප්‍රියදර්ශනි මෙනවිය | පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු | 2004.05.24සිට2018.12.31 දක්වා |
| 5 | ආර්.එම්.එන්.රත්නායක මහත්මිය | පරිගණක වැඩසටහන් සහකාර / ලිපිකරු | 2013.03.18සිට2018.12.31 දක්වා |
| 6 | ටී.ජී.ප්‍රනාන්දු මහතා | කාර්යාල කාර්ය සහායක | 2004.07.15සිට2018.12.31 දක්වා |

## 08. ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්

### 1. ලියාපදිංචි කිරීම


සමාලෝචිත වර්ෂය සඳහා, එනම්, 2018 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ලද පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ඒ එක් එක් මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම්, පළපුරුද්ද, හැකියාව සහ නිපුණතාවය ඇති බවට පරීක්ෂා කර බලන ලදී.

ඒ අතුරින් සභාව සෑහීමකට පත්වීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළදී මිනින්දෝරුවරුන් 62 ක් ඉඩම් මැනුම් සභාව විසින් අලුතින් ලියාපදිංචි කරන ලදී.ඒ අනුව 2018 දෙසැම්බර්31 දිනට සභාවේ ලියාපදිංචිය ලබා ගත් මුළු මිනින්දෝරු සංඛ්‍යාව 2163කි.

### 2. වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම 2017 සැප්තැම්බර් මාසයේදී අරඹන ලදී. අනතුරුව, ඒ සඳහා එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව පරීක්ෂා කර බැලීමෙන් පසුව 2018 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාව විසින් අලුතින් වාර්ෂික බලපත් 957 ක් නිකුත් කරනලදී. මෙය, 2017 වසර තුළ නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍ර සංඛ්‍යාව වන 1004 සමඟ සැසඳීමේදී 3.6% ක අඩුවීමක් බව නිරීක්ෂණය වේ.

2017 සහ 2018 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරු පහත දැක්වෙන 1 වන රූපය මගින් ප්‍රස්තාරිකව නිරූපණය කර ඇත.



2018 ජනවාරි 1 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ සමාලෝචිත වර්ෂය සඳහා 2018 පෙබරවාරි මස 28 දිනට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මූලික තොරතුරු, එනම්, මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන තොරතුරු 2018 මාර්තු මස 23 වන දිනැති අංක 2011/24 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර පළ කිරීමට සභාව කටයුතු කරන ලදී.

එයට අමතරව, වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ අදාළ සියලු තොරතුරු, එනම්, ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, ඊ මේල් ලිපිනය, වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය ආදී තොරතුරු ඉඩම් මැනුම් සභාවේ නිල වෙබ් අඩවියට (www.landsurveycouncil.org)ඇතුළත් කර ඇත. මෙම විස්තර නිතිපතා / දිනපතා යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

## 3. මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳව මහජනතාව මේ වන විට මනාව දැනුවත් වී ඇත. එබැවින්, වසර සිය ගණනක් පැරණි පිඹුරු සම්බන්ධයෙන් වුවද, ඊට අදාළ මැනුම් කටයුතු කර ඇති බලයලත් මිනින්දෝරුවරුන්ගේ ජීව දත්ත තොරතුරු ලබා ගැනීම සඳහා ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් පසු ගිය කාලය තුළ සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ඊට අමතරව, විද්‍යුත් තැපැල මගින්ද එම තොරුතුරු සඳහා නිරතුරුවම ඉල්ලීම් ලැබේ. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීමට මැනුම් සභා කාර්ය මණ්ඩලය ඉමහත් කැපවීමකින් කටයුතු කරන අතර, එහිදී එම තොරතුරු එසැනින් ලබා දීමට හැකි සෑම විටම කටයුතු කරනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 191 ක දී තොරතුරු ලබා දී ඇත.

වාර්ෂික බලපත්‍රලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, දුරකථන අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. ඊට අමතරව, ඔවුන්ගේ ඡායා රූපයක්ද එම දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට ඉදිරියේදී කටයුතු කෙරෙනු ඇත. මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංක ඇතුළු සම්බන්ධතා තොරතුරු ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනීමට ඔවුන් කෙලින්ම සම්බන්ධ කර ගැනීමේ පහසුකම මෙමගින් මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද, මේ දක්වා මැනුම් සභාව විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙල කළ පැරණි පිඹුරු වල පිටපත් ලබා ගැනීමේ ක්‍රම වේදයක් සකස් කිරීමට නොහැකි වී ඇත. මැනුම් කටයුතු සම්බන්ධයෙන් මහජනතාව

මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට සභාවේ අවධානය යොමු වී ඇත.

## 4. ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි

බලයලත් මිනින්දෝරුවරුන්විසින් කරනු ලබන වෘත්තීමය විෂමාචාර වලට සම්බන්ධව මහා ජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තවයකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කෙරෙනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන වලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක් ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක සභා වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ඉඩම් ගැටළු සම්බන්ධයෙන් පවතින ගැටළු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතර මිනින්දෝරුවරුන් අතර විනය පවත්වා ගෙන යාමට ක්‍රියා මාර්ගයක්ද සැලසෙනු ඇත.


කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව, එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකළ නොහැකි පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාළ පැමිණිලිකරුවන්ට එම ගැටළු අධිකරණ ක්‍රියා මාර්ගයෙන් විසඳා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2016 වසරේ ලැබී විභාග කර අවසන් නොවූ පැමිණිලි හා 2018 වසරේ තුළ විභාග කළ පැමිණිලි පිළිබඳ සංඛ්‍යා තොරතුරු මෙහි පහතින් දැක්වේ.

| | |
|---|---|
| 2018 ජනවාරි මස 1 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව | = 29 |
| 2018 වසර තුළදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | = 49 |
| 2018 වසර තුළදී විභාග අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | = 47 |
| 2018 දෙසම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව | = 31 |

2017 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 96 වූ අතර එයට සාපේක්ෂව 2018 වසර තුල පැමිණිලි ලැබීමේ ප්‍රතිශතය 49%කින් අඩුවී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2017 වසරේදී 91 ක් වූ අතර එයට සාපේක්ෂව 2018 වසරේ පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය 48% කින් අඩු වී ඇති බව නිරීක්ෂණය වේ.

මෙම දත්ත පහත දැක්වෙන 2 වන රූපය මගින් ප්‍රස්තාරිකව නිරූපණය කර ඇත.




2 වන රූපය

## 5. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි අයට එරෙහිව 2002 අංක 17 දරණ මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව දඬුවම් පමුණුවාලිය හැක.

2018 වසරේදී ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි, ලැබෙන පැමිණිලි විභාග පවත්වනු ලැබීමෙන් පසුව ගන්නා ලද තීරණ අනුව වග උත්තරකාර මිනින්දෝරුවරුන්ට පහත සඳහන් පරිදි දඬුවම් පමුණුවන ලදී.

| | |
|---|---|
| ලියාපදිංචිය අවලංගු කළ සංඛ්‍යාව | = 01 |
| ලියාපදිංචිය තාවකාලිකව අත්හිට වූ සංඛ්‍යාව | = 01 |
| වාර්ෂික බලපත්‍රය අවලංගු කළ සංඛ්‍යාව | = 00 |
| වාර්ෂික බලපත්‍රය තාවකාලිකව අත්හිට වූ සංඛ්‍යාව | = 02 |

2018 වසර තුළදී විභාග කොට අවසන් කරන ලද පැමිණිලි අතුරින්,එලෙස දඬුවම් පමුණුවන ලද මිනින්දෝරුවරුන් පිළිබඳ විස්තර පහත වගු අංක 1 හි දක්වා ඇත.

| පැමිණිලි අංක | ලියාපදිංචි අංක | මිනින්දෝරුවරයාගේ නම | ගන්නා ලද ක්‍රියා මාර්ගය |
|---|---|---|---|
| LSC/5/996 | 20071660 | ආර්.ඩී.ලියනගේ/ 20171660 | මාස 6කට බලපත්‍රය අත්හිටුවන ලදී. |
| LSC/5/984 | 20071268 | ඩබ්.ඩී.එස්.එච්.දිසානායක / 20071268 | 2018.09.01 සිට 2019.02.28 දක්වා ලියාපදිංචිය අත්හිටුවන ලදී. |
| LSC/5/982 | 19851781 | ඩබ්.ජී.ප්‍රේමරත්න / 19851781 | ලියාපදිංචිය අවලංගු කරන ලදී. 2018.09.01 සිට |
| LSC/5/972 | 19900996 | පී.අයි.මල්ලිකා / 19900996 | 2018.10.01 සිට 2019.12.31 දක්වා මාස 12 කට බලපත්‍රය අත්හිටුවන ලදී. |

## 09. අධ්‍යාපන හා පුහුණු වැඩසටහන්

### 1. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ( CDP) පාඨමාලා

බිම්මැනීම හා සම්බන්ධ විෂයයන් ගත්කළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය අත්‍යවශ්‍ය අංගයක් වේ. මැනුම් වෘත්තියේ යෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩි දියුණු කරලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යයක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ විධි විධාන සලස්වා ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළු වලට සහභාගි කරවීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියැලීමට අපේක්ෂා කරන ආධුනික මැනුම් වෘත්තිකයන් දිශානුගත කිරීමේ වැඩසටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා

දියුණු තාක්ෂණික ක්‍රම වලට අදාල වැඩසටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ.

### 2. ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස තම ජීවන වෘත්තියට ප්‍රථම වරට පිවිසෙන අවස්ථාවේදී ඔවුන් සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා

පැවැත්වීම ඉඩම් මැනුම් සභාව විසින් වාර්ෂිකව සිදු කරයි. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා තාක්ෂණික දැනුමක් හා පළපුරුද්දක් සහිත කීර්තිමත් ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය දැනුම සහ අවබෝධය ලබා දීම සිදු කෙරෙනු ඇත.

## 3. බාහිර ආයතන විසින් පවත්වනු ලැබූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා

ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමෙහි ලා විශේෂ උනන්දුවකින් කටයුතු කරයි. එම පාඨමාලා ඉඩම් මැනුම් සභාවේ නියාමනය යටතේ පවත්වනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ඉහත සඳහන් කළ බාහිර ආයතන දක්වනු ලබන උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත් වේ.

2018 වසරේදී පවත්වා ඇති අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.


| අනු අංකය | ආයතනය | වෘත්තීය සංවර්ධන පාඨමාලාව | පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකාමිනින්දෝරු ආයතනය | CORS Network , CORS.compatible survey Equipment & Digital Leveling | 2018.01.26 |
| 2 | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Modern Survey Application Techniques | 2018.02.25 |
| 3 | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Condominium Program | 2018.08.27 |
| 4 | ඉඩම් මැනුම් සභාව | Orientation Program | 2018.03.23 |
| 5 | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | Condominium Surveys related with Bimsaviya | 2018.04.05 |
| 6 | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | Court Commission Surveys | 2018.05.26 |
| 7 | ඉඩම් මැනුම් සභාව | Digital Elevation System (Batch 01) | 2018.06.22 |
| 8 | ඉඩම් මැනුම් සභාව | Digital Elevation System (Batch 02) | 2018.08.09 |
| 9 | ශ්‍රී ලංකාමිනින්දෝරු ආයතනය | Professionalism, Ethics, & Panel Discussion | 2018.09.03 |
| 10 | ඉඩම් මැනුම් සභාව | Modern Surveying System | 2018.09.07 |
| 11 | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | CAD Secrets and Statutory Laws Governing Surveys | 2018.10.26 |

## 10. මූල්‍ය කළමනාකරණය

### 1). මුළු ආදායම සහ මුළු වියදම

2018 වසර තුළදී ඉඩම් මැනුම් සභාව රැස් කරන ලද මුළු ආදායම රුපියල් 4,511,475.54 ක් වූ අතර එම වසර තුළදී දරන ලද මුළු වියදම 5,262,659.91 විය. ඒ අනුව 2017 වසර සමග සැසඳීමේදී, 2018 වසර තුළදී සභාව රැස් කරන ලද ආදායම සහ වියදම පිළිවෙලින් රුපියල් 601,099.24 කින් සහ රුපියල් 339,244.63 කින් වැඩි වී ඇත.

පහත දැක්වෙන 3 වැනි රූපයේ 2017 සහ 2018 වසර වල මුළු ආදායම සහ වියදම ප්‍රස්තාරිකව නිරූපණය කර ඇත.




3 වැනි රූපය

### 2). සභාවේ අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ධ අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඉටු කිරීමෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග, ප්‍රදාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56(3) වගන්තිය යටතේ සලසා ඇති විධි විධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

ඉඩම් මැනුම් සභාවට මහා භාණ්ඩාගාරයෙන් පෙර වසර දෙකකදී පමණක් මූල්‍ය ප්‍රතිපාදන ලැබී ඇත. එහෙත්, 2018 වසරේදී කිසිදු ප්‍රතිපාදන මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී

නැත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදීර්ට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරන ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. මැනුම් සභාවේ සියලු මුදල් මැනුම් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.

මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව, පුහුණු වැඩසටහන් සහ වැඩ මුළු පැවැත්වීමෙන්, මහජනතාවට තොරතුරු නිකුත් කිරීමෙන්, මහජන පැමිණිලි ඇතුළත් කිරීමෙන් සහ පරීක්ෂණ ගාස්තු ලෙස චූදිත මිනින්දෝරුවරුන්ගෙන් අයකරන පරීක්ෂණ ගාස්තු ආදියෙන්ද මැනුම් සභාවට අරමුදල් එක්රැස් වේ.

2018 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට මැනුම් සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ තිබූ අරමුදල් ශේෂය රුපියල් 6,516,499.77 ක් විය.

## 3). මූල්‍ය කටයුතු විගණනය

මැනුම් සභව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ. විගණන කළමනාකරණ කමිටුවක්ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

i). මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු (සභාපති)
ii). මැනුම් සභාවේ ලේකම් (ලේකම්)
iii). විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු (නිරීක්ෂක)
iv). මැනුම් සභාවේ සභිකයින් දෙදෙනකු (සාමාජික)
v). මැනුම් සභාවේ ගණකාධිකාරී (සාමාජික)

ත්‍රෛයිමාසිකව මෙම කමිටුව රැස් වන අතර එහිදී, සභාවේ කටයුතු විශ්ලේෂණාත්මකව විමසා බලනු ලැබීමෙන් පසු එකී කමිටු වාර්තා මැනුම් සභාවේ අවධානයට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරේ. 2018 වසර සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිගේ විගණන වාර්තාව මෙහි අඩංගු කොට ඇත.

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් නිෂ්ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

එස් සිවානන්දරාජා
සභාපති
ඉඩම් මැනුම් සභාව

Chairman
Land Survey Council

# 2018 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශන

ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

**2018 දෙසැම්බර් 31 වන දිනට**

**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය**

| විස්තරය | සටහන් | 2018 | | 2017 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1 | 765,643.44 | | 954,351.59 | |
| ස්ථාවර තැන්පතු | | | | 5,000.000.00 | |
| | | | **765,643.44** | | **5.954,351.59** |
| | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| ආපදා ණය | 2 | 390,335.00 | | 320,665.00 | |
| ලැබිය යුතු දෑ | 3 | 6,516,499.77 | | 500,000.00 | |
| ස්ථාවර තැන්පතු | 4 | 313,877.06 | | 956,447.92 | |
| මුදල් හා මුදල් සමාන දෑ | 5 | 2,160,888.26 | | 1,712,222.08 | |
| | | | **9,381,600.09** | | **3.489,335.00** |
| | | | | | |
| **මුළු වත්කම්** | | | **10,147,243.53** | | **9,443,686.59** |
| | | | | | |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන සැපයුම** | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030.00 | | 1.043,030.00 | |
| සමුච්චිත අරමුදල | | 7,588,107.47 | | 5,678,559.95 | |
| අතිරික්තය/හිඟය | | (751,184.37) | | (1,013,038.98) | |
| | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | 6 | 500,172.00 | | | |
| | | | **8,380,125.10** | | **5,708,550.97** |
| **ජංගම වගකීම්** | | | | | |
| ගෙවිය යුතු වියදම් | 7 | 439,080.18 | | 370,598..12 | |
| උපචිත වියදම් | 8 | 23,388.25 | | - | |
| හඳුනා නොගත් කලින් ලැබීම | 9 | 1,304,650.00 | | 3,364,537.50 | |
| | | | | | |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | **10,147,243.53** | | **3,735,135.62** |

**ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල් ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකහන් වගකියනු ලැබේ.මෙම මූල්‍ය ප්‍රකාශහන් හි සටහන් මඟින් හෙලිදරවු කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.**

**එච්.එම්.බී.පී. හේරත්**
**ලේකම්**
**සංචාරක හා ඉඩම් අමාත්‍යංශය**

එච්.එම්.බී.පී. හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,

**එස්. සිවානන්දරාජා**
**සභාපති**
**ඉඩම් මැනුම් සභාව**

Chairman
Land Survey Council

**කේ.එල්.ඒ.එන් සඳමාලි**
**ගණකාධිකාරී**
**ඉඩම් මැනුම් සභාව**

Accountant
Land Survey Council

## ඉඩම් මැනුම් සභාව

## 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධනය

| විස්තරය | | සටහන | 2018 | | 2017 | |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | | |
| | බලපත්‍ර ගාස්තුව | | 2,392,500.00 | | 2,510,000.00 | |
| | ලියාපදිංචි ගාස්තුව | | 150,500.00 | | 31,500.00 | |
| | ස්ථාවර තැන්පතු පොලී ආදායම් | 8 | 575,309.28 | | 676,304.76 | |
| | වෙනත් ආදායම් | 9 | 222,276.96 | | 165,311.54 | |
| | වැඩමුළු ශුද්ධ ආදායම | 10 | 1,170,889.30 | | 527,260.00 | |
| | මුළු ආදායම | | | **4,511,475.54** | | **3,910,376.30** |
| **අඩු: වියදම්** | | | | | | |
| | <u>ආයතන හා පරිපාලන වියදම්</u> | | | | | |
| | වැටුප් හා වේතන | 11 | 1.604.371.15 | | 1,006.388.93 | |
| | අතිකාල හා නිවාඩු දින දීමනා | | - | | 24,292.28 | |
| | වෙනත් දීමනා | 12 | 1,765,396.25 | | 2,663.377.67 | |
| | දේශීය ගමන් වියදම් | | 13,905.00 | | 13,356.00 | |
| | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 160,154.30 | | 148,399.79 | |
| | ආහාර පාන වියදම් | | 125,526.00 | | 181.448.25 | |
| | යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම් | | 94,674.34 | | 19,722.50 | |
| | යන්ත්‍ර උපකරණ ගොඩනැගීමේ වියදම් | | 59,110.92 | | 95,360.88 | |
| | තැපැල් හා සන්නිවේදන | | 181,556.00 | | 164,105.97 | |
| | විදුලිය | | 74,534.40 | | 74,534.40 | |
| | ජලය | | 4.200.00 | | 4.200.00 | |
| | විගණන ගාස්තු | | 50,000.00 | | 173,800.00 | |
| | වෙනත් වියදම් | 13 | 939,773.40 | | 156,633.25 | |
| | | | | 5,073,201.76 | | 4,725,619.92 |
| | <u>මූල්‍ය හා වෙනත් වියදම්</u> | | | | | |
| | බැංකු ගාස්තු | | 750.00 | | - | |
| | ක්ෂයවීම | | 188,708.15 | | 197,795.36 | |
| | මුළු වියදම් | | | 5,262.659.91 | | 4,923,415.28 |
| කාලසීමාවට අදාල අතිරික්තය/ඌනතාව | | | | **(751,184.37)** | | **(1,013,038.98)** |

**ඉඩම් අමාත්‍යාංශය**

**ඉඩම් මැනුම් සභාව**

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය**

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌනතාවය | එකතුව |
|---|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 4,665,520.97 | 5,708,550.97 |
| එකතු<br>පෙර වර්ෂයේ ගැළපීම් කලින් ලැබීම් | | 3,364,537.50 | 3,364,537.50 |
| එකතු<br>පෙර වර්ෂයේ ගැළපීම් පැමිණිලි | | 15,000.00 | 15,000.00 |
| එකතු<br>පෙර වර්ෂයේ ගැළපීම් පාරිතෝෂික සඳහා වෙන් කිරීම | | (456,951.00) | (456,951.00) |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම | | 500,172.00 | 500,172.00 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | (751,184.37) | (751,184.37) |
| 2018දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 7,337,095.10 | 8,380,125.10 |

**ඉඩම් අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**
**2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විස්තරය | සටහන | 2018 | | 2017 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| <u>මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍රවාහ</u> | | | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | (751,184.37) | | (1,013,038.98) | |
| | | | | | |
| <u>මුදල් නොවන සංචලනයන්</u> | | | | | |
| ක්ෂයවීම | | 188,708.15 | | 197,795.36 | |
| පාරිතෝෂික | | 43,221.00 | | | |
| ස්ථාවර තැන්පතු පොළිය | | (575,309.28) | | (676,304.76) | |
| | | | | | |
| මූලධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | | **(1,094,564.50)** | | **(478,509.40)** |
| | | | | | |
| <u>මුලධන වෙනස්වීම්</u> | | | | | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | (69,670.00) | | (102,250.00) | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (30,000.00) | | (46,500.00) | |
| ස්ථාවර තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | 0 | | 1,000,000.00 | |
| ගෙවිය යුතු වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | 23,388.25 | | (234,595.62) | |
| උපචිත වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | 68,482.06 | | 78,706.55 | |
| හඳුනානොගත් ලැබීම්හි වැඩිවීම/(අඩුවීම) | | 1,304,650.00 | | 636,100.00 | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **202,285.81** | | **1,424,460.93** |
| <u>ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ</u> | | | | | |
| ස්ථාවර තැන්පතු (වැඩිවීම)/අඩුවීම | | (1,016,499.77) | | 181,356.84 | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | | | | (76,597.00) | |
| ස්ථාවර තැන්පතු පොළිය | | 1,262,880.14 | | | |
| | | (76,597.00) | | (76,597.00) | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | **246,380.37** | | **104,759.84** |
| | | | | | |
| <u>මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ</u> | | | - | | - |
| **පෙර වර්ෂයේ ගැළපීම් සමුච්චිත අරමුදල සඳහා** | | | | | |
| **මුදල් හා මුදල් සමාන දෑ වල දළ වැඩිවීම/(අඩුවීම)** | | | **448,666.18** | | **37,672.39** |
| **කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ** | | | **1,712,222.08** | | **2,174,549.69** |
| **කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමානදේ** | | | **2,160,888.26** | | **2,212,222.08** |

**ඉඩම් මැනුම් සභාව**
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාළ සටහන්

1 **යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ**

| අයිතම | 2018-01-01 දිනට ශේෂය රු. | වර්ෂය තුළදී මිලදී ගැනීම රු. | එකතුව රු. | ක්ෂය වීම % | වාර්ෂික ක්ෂයවීම රු. | 2018.12.31 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| **ස්පෘශ්‍ය වත්කම්;** | | | | | | |
| යන්ත්‍රෝපකරණ | ***149,743.12*** | | 149,743.12 | 20 | 29,948.63 | ***119,794.49*** |
| ගෘහභාණ්ඩ | ***134,687.71*** | | 134,687.71 | 10 | 13,468.77 | ***121.218.94*** |
| පරිගණක | ***272,201.11*** | | 272,201.11 | 25 | 68,050.28 | ***204,150.83*** |
| කාර්යාලීය උපකරණ | ***15,833.92*** | | 15,833.92 | 25 | 3,958.48 | ***11,875.44*** |
| ඉමැසනාම පුවරුව | ***25,267.97*** | | 25,267.97 | 20 | 5,053.59 | ***20,214.38*** |
| ගොඩනැගිලි හා පිරියත | **325,666.24** | | 325,666.24 | 20 | 65,133.25 | **260.532.99** |
| **අස්පෘශ්‍ය වත්කම්:** | | | | | | |
| ගිණුම් මෘදුකාංගය | **30,951.52** | | 30,951.52 | 10 | 3,095.15 | **27,856.37** |
| එකතුව | **954,351.59** | | **954,351.59** | | **188,708.15** | **765,643.44** |

2 **ආපදා ණය**

| නම | ණය මුදල | මුළු මුදල |
|---|---|---|
| **ආර්.එම්.එන්.රත්නායක** | **213,730.00** | |
| **ටී.ජී.ප්‍රනාන්දු** | **176,605.00** | |
| | | **390,335.00** |

**3 ස්ථාවර තැන්පතු**

| ස්ථාවර තැන්පතු අංකය | කාල සීමාව | වටිනාකම | මුලු මුදල |
|---|---|---|---|
| 82652562 | 1 වසර | 1,000,000.00 | |
| 82652638 | 1 වසර | 1,000,000.00 | |
| 82652551 | 1 වසර | 1,000,000.00 | |
| 82652648 | 6 මාස | 1,050,284.93 | |
| 82652661 | 6 මාස | 1,050,284.93 | |
| 81787043 | 6 මාස | 500,000.00 | |
| 82652606 | 3 මාස | 315,071.01 | |
| 83560278 | 3 මාස | 600,858.90 | |
| | | | 6,516,499.77 |

4 ලැබිය යුතු දෑ

| අයිතමය | මුදල | මුළු මුදල |
|---|---|---|
| ස්ථාවර තැන්පතු පොළී | 242,377.06 | |
| වැඩමුළු ආදායම | 4,000.00 | |
| පැමිණිලි ගාස්තු | 67,500.00 | |
| | | 313,877.06 |

5 මුදල් හා සමාන දෑ

| ඉල්ලුම් තැන්පතු | තැන්පතු අංකය | | | | |
|---|---|---|---|---|---|
| | 83504757 | 301,288.35 | | | |
| | 83504803 | 301,288.35 | | | |
| | | | 602,576.70 | | |
| | | | | | |
| බැංකුවේ ඇති මුදල | | | | 1,552,158.56 | 953,060.17 |
| අතැති මුදල් | | | | 6,153.00 | 0 |
| | | | | | 2,160,888.26 |

6 උපචිත වියදම්

| වියදම් | රු. | රු. |
|---|---|---|
| භාෂා පරිවර්තන වියදම් | 9,647.50 | |
| කැපැල් හා සන්නිවේසන වියදම් | 2,603.68 | |
| විගණන ගාස්තු | 402,229.00 | |
| පාලක මන්ඩල දීමනා | 24,600.00 | |
| | | 439,080.18 |

7 ගෙවිය යුතු වියදම්

| වියදම් | රු. | රු. |
|---|---|---|
| උපයන විට ගෙවීම් බදු | 18,513.25 | |
| මුද්දර බද්ද | 4,875.00 | |
| | | 23,388.25 |

**8** ස්ථාවර තැන්පත් පොළී

| අනු අංකය. | තැන්පතු අංකය | රු. | රු |
|---|---|---|---|
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය | | | |
| 1 | 81786998 | 17,218.83 | |
| 2 | 74891 | 128,333.33 | |
| 3 | 81787043 | 43,745.11 | |
| 4 | 80945454 | 4,433.41 | |
| 5 | 80945401 | 7,853.15 | |
| 6 | 82652579 | 12,271.92 | |
| 7 | 82652606 | 15,071.01 | |
| 8 | 83504757 | 1,288.35 | |
| 9 | 83504803 | 1,288.35 | |
| 10 | 83560278 | 858.90 | |
| 11 | 82652648 | 50,284.93 | |
| 12 | 82652661 | 50,284.93 | |
| | | | **332,932.22** |
| 13 | 82652562 | 66,031.51 | |
| 14 | 82652606 | 4,001.71 | |
| 15 | 82652638 | 66,031.51 | |
| 16 | 83560278 | 4,007.44 | |
| 17 | 82652551 | 66,031.51 | |
| 18 | 82652648 | 14,925.56 | |
| 19 | 82652661 | 14,925.56 | |
| 20 | 81787043 | 6,422.26 | |
| | | | **242,377.06** |

**9** වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| මහජනයා වෙත මිනින්දෝරු විස්තර නිකුත් කිරීමේ ආදායම් | 43,600.00 | |
| බලපත්‍ර ප්‍රමාද ගාස්තු | 60,000.00 | |
| බාහිර ආයතන විසින් පවත්වන පාඨමාලා ගාස්තු ආදායම් | 27,280.00 | |
| පැමිනිලි ලියාපදිංචි කිරීමේ ආදායම් | 28,350.00 | |
| පැමිනිලි සඳහා දඩ මුදල් ආදායම් | 37,500.00 | |
| වැටුප් රහිත නිවාඩු ආදායම් | 7,412.70 | |
| මුද්‍රිත පිටපත් විකිණීමේ ආදායම් | 500.00 | |
| ආපදා ණය පොලී ආදායම් | 17,340.86 | |
| විශේෂ අත්තිකාරම් පොලී ආදායම් | 293.40 | |
| | | 222,276.96 |
| | | |

**10** වැඩමුළු ශුද්ධ ආදායම

| අයිතමය | මුදල | ශුද්ධ මුදල |
|---|---|---|
| ආදායම | 2,056,425.00 | |

| | | |
|---|---|---|
| වියදම් | (885,535.70) | |
| | | 1,170,889.30 |

**11 වැටුප් හා වේතන**

| වියදම | මුදල | මුලු මුදල |
|---|---|---|
| වැටුප් හා වේතන | 1,032,522.39 | |
| ජීවන වියදම් දීමනාව | 280,800.00 | |
| ගැළපුම් දීමනාව | 81,782.96 | |
| සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 167,412.64 | |
| සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 41,853.16 | |
| | | 1,604,371.15 |

**12 වෙනත් දීමනා**

| **දීමනා** | **වියදම** | මුලු වියදම |
|---|---|---|
| සභාපතිගේ කාර්ය දීමනා | 450,000.00 | |
| උප සභාපතිගේ කාර්ය දීමනා | 360,000.00 | |
| වැඩබලන ලේකම්වරයාගේ කාර්ය දීමනා | 115,590.00 | |
| ගණකාධිකාරිගේ කාර්ය දීමනා | 111,566.25 | |
| පාලක මණ්ඩල සාමාජික දීමනා | 644,240.00 | |
| විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 84,000.00 | |
| ජීවන වියදම් දීමනා | 280,800.00 | |
| අන්තර් /ගැළපුම් දීමනා | 265,203.42 | |
| විශේෂ දීමනා | 41,239.25 | |
| පුහුණු සේවක දීමනා | 108,250.00 | |
| | | **1,765,396.25** |

**13 වෙනත්**

| අයිතමය | වියදම | මුලු වියදම |
|---|---|---|
| ලැමිනේටින් | 11,700.00 | |
| මුද්‍රණ සහ පොත් බැඳීම් | 625,208.50 | |
| ප්‍රචාරණ | 181,603.90 | |
| විවිධ වියදම් | 7,490.00 | |
| පරිවර්තන ගාස්තු | 18,550.00 | |
| පුහුණු පාඨමාලා ගාස්තු | 25,000.00 | |
| පාරිතෝෂික වෙන් කිරීම | 43,221.00 | |

| | | |
|---|---|---|
| | | 939,773.40 |

# ඉඩම් මැනුම් සභාව
## 2018-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
## පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු ගිණුම් ප්‍රතිපත්ති

1.1. සැකසීමේ පදනම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කරනු ලැබේ.

1.2. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

**2.** වත්කම් ඇගයීමේ පදනම

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍රමය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| නාම පුවරුව | 20 |
| ගොඩනැගිලි හා පිරියත | 20 |
| ගිණුම් මෘදුකාංගය | 10 |

# 12. විගණකාධිපති වාර්තාව 2018

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. ඒජීඑල්/බී/එල්එස්සී/01/18/03 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2019 මැයි 29 දින

සභාපති

ඉඩම් මැනුම් සභාව

**ඉඩම් මැනුම් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉඩම් මැනුම් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**ගිණුම්කරණ දෝෂ**

සමාලෝචිත වර්ෂයේදී ආදායමට ලැබුණු මුදලින් ආදායම් ප්‍රභවය නිශ්චිතව හඳුනාගත නොහැකිව තිබුණු රු.1,304,650 ක මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීමක් ලෙස පෙන්වාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය සහ ජංගම වගකීම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම් උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තිය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යයන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේනම් මාගේ මතය විකරණය කල යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර, සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට අසීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණය හැර** යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීති රීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2002 ඔක්තෝබර් 04 දිනැති අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 43(1) හා (2) වගන්ති | සභාව විසින් සෑම වර්ෂයකම මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකරනු ලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 957 ක් වුවද, 2018 අප්‍රේල් 20 දිනැති අංක 2068 දරන ගැසට් පත්‍රයේ මිනින්දෝරුවරු 864 දෙනෙකුගේ නම් පමණක් පල කර තිබුණි. |
| (ආ) 2018 මාර්තු 26 දින 221 වෙනි සභා රැස්වීම් තීරණය. | සභාවේ ලියාපදිංචි නොවී මැනුම් කටයුතු සිදුකරන සුදුසුකම් නොලත් පුද්ගලයින් සම්බන්ධයෙන් සොයා බැලීමට පොලිස්පතිවරයා දැනුවත් කිරීමට තීරණය කර තිබුණ ද එම තීරණය අනුව කටයුතු කර නොතිබුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත සඳහන් නිරීක්ෂණය** හැර සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.
    - අයවැය ලේඛනයේ පුහුණු දීමනා ගෙවීම සඳහා රු.180,000 ක් ද, මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු.435,000 ක් ද, ප්‍රතිපාදනය කර තිබුණද යථෝක්ත වියදම් දරා නොතිබුණි.

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) පුරප්පාඩුව පවතින ලේකම් තනතුරට නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජුලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට 2019 මාර්තු 31 දක්වාම කටයුතු කර නොතිබුණි. තවද පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතු, ගිණුම්කරණ කටයුතු සහ මහජන සම්බන්ධතා පවත්වා ගැනීමේ කටයුතු සඳහාත් නිළධාරීන් බඳවාගෙන නොතිබුණි.

(ආ) 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2019 මැයි 27 දින වන විටත්, කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති